17

ප්‍රත්‍යයාර්ථ නාම

'ප්‍රත්‍යයාර්ථ ශබ්ද' හෙවත් 'ප්‍රත්‍යයාර්ථ නාම' සිංහල භාෂාවෙහි පද සෑදෙන ක්‍රමයකි. ප්‍රත්‍යය ප්‍රධාන කොට සිදු වන මේ වියරණ විධිය හැදෑරීමේ දී 'ප්‍රත්‍යය' යනු කුමක් දැයි වටහා ගත යුතු ය.

ප්‍රත්‍යය යනු 'ප්‍රකෘතියකින් පරව අර්ථවත් වූ පද සාධනය සඳහා එකතු වන කොටසකි.

'ප්‍රත්‍යයාර්ථ නාම' යන යෙදුම සැදී ඇත්තේ ප්‍රත්‍යය + අර්ථ යන පද දෙක එක් වීමෙනි. ඒ අනුව ප්‍රත්‍යයාර්ථ නාම යනු ප්‍රත්‍යය නිසා අර්ථ ගැන්වෙන නාම යන්න යි. 'ප්‍රත්‍යයාර්ථ නාම' සඳහා කුමාරතුංග මුනිදාස මහතා භාවිත කළේ 'ප්‍රත්‍යය සංග්‍රහ නාම' යන වහර ය. ඒ සඳහා ම 'සිංහල භාෂාව' නම් ව්‍යාකරණ ග්‍රන්ථයේ තියඩෝර් ජී. පෙරේරා පියතුමා සඳහන් කර ඇත්තේ 'ප්‍රත්‍යයාර්ථ ශබ්ද' හෙවත් 'පසරුත් සද' යන්න යි.

ප්‍රත්‍යය භාවිතයෙන් අර්ථ ගැන්වීමට භාෂාවෙහි මුල් වන්නේ නාම ප්‍රකෘති හා ධාතු ප්‍රකෘති යන භාෂාංග දෙක ය. නාම ප්‍රකෘතියක් යනු නාම පදයකට මුල් වන කොටස යි. ධාතු ප්‍රකෘතියක් යනු ක්‍රියා පදයකට මුල් වන කොටස යි. මේ භාෂාංග දෙක සඳහා කිසියම් ප්‍රත්‍යය එක් වීමෙන් නාමාර්ථයක් ලැබේ නම් ඒවා 'ප්‍රත්‍යයාර්ථ නාම' වේ. සිංහල භාෂාවේ ප්‍රත්‍යයාර්ථ නාම දෙකොටසකි.

1. නාම ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන ප්‍රත්‍යයාර්ථ නාම - තද්ධිත,

2. ආඛ්‍යාත ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක්වීමෙන් සෑදෙන ප්‍රත්‍යයාර්ථ නාම - කෘදන්ත, වශයෙනි. මේ එකිනෙකින් පද සාධනය වන අයුරු මේ පාඩමේ විස්තර කෙරේ.

තද්ධිත

අලුයම පිබිදුණු **ගැමියා** තම ගොවිපළට පිටත්ව ගියේ ය.

මේ වාක්‍යයේ තද්ධිත නාම පදය වන්නේ 'ගැමියා' යන පදය යි. එම පදය සකස්ව ඇත්තේ

ගම් + ඉ = ගැමි + ආ = ගැමියා

වශයෙනි. තොටියා, නැවියා, රැටියා යන තද්ධිත නාම ද සකස් වන්නේ ඉහත ඉදිරිපත් කළ නිදසුනේ සඳහන් ක්‍රමයට ය. මේ උදාහරණය අනුව නාම ප්‍රකෘතියකට තද්ධිත ප්‍රත්‍යය එක් වී සෑදෙන නාම 'තද්ධිත නාම' බව පැහැදිලි වෙයි. තද්ධිත යනු **තත්** + **හිත** යන පද ඇසුරෙන් සෑදුණකි. **තත්** + **හිත** යන්නේ අර්ථය ඒ හා යෙදුණු ඊට යෝග්‍ය වූ යන්න යි. එක් නාම ප්‍රකෘතියකට ප්‍රත්‍යය එක් කළ විට තැනෙන නාම පදය මුල් පදයට අනුරූපව සකස් වන නිසා එම ක්‍රියාවලිය තද්ධිත යනුවෙන් හඳුන්වා තිබේ. මේ තද්ධිත යන්න අපේ බසට ලැබී ඇත්තේ සංස්කෘත හා පාලි වියරණ රීති ඇසුරෙනි.

තද්ධිත ශබ්දවල දී ඊට සම්බන්ධ වන ප්‍රත්‍යයෙන් ප්‍රකාශ වන තේරුම මුල් වෙයි. එහෙත් එය එහි ප්‍රධාන පදයේ අර්ථයට අනුකූලව සකස් වේ. ඉහත ඉදිරිපත් කළ 'ගැමියා' යන පදය විමසා බැලීමෙන් ඉදිරිපත් කළ කරුණ වඩාත් පැහැදිලි වෙයි.

තද්ධිත නාම සකස් කර ගත හැකි තද්ධිත ප්‍රත්‍යය යෙදුණු පද දාහතරක් සිදත් සඟරාවේ දැක්වේ. අනතුරුව එබඳු ප්‍රත්‍යය 23ක් කුමාරතුංග මුනිදාස මහතා ඉදිරිපත් කර තිබේ. ඒ මෙසේ ය.

ඉ, මුවා, මය, වත්, මත්, තර, තම, ඉති, අටි, අටු, අස්, අත්, බ, තා, ආණ, අණු, අණි, අ, එක්, උ, අළ, ආ, උතු වශයෙනි.

මෙබඳු තද්ධිත ප්‍රත්‍යය විවිධාර්ථ දෙමින් පද සාධනයට ඉවහල් වෙයි. භාෂාව පෝෂණය කරයි. හැඩ කරයි. ඉන් කිහිපයක් පිළිබඳ කරුණු විමසා බලමු.

1. 'ඉ' ප්‍රත්‍යය

මේ ප්‍රත්‍යය අර්ථ ගණනාවක යෙදේ. ඒ අර්ථ අඩු වැඩි වශයෙන් වියරණ ග්‍රන්ථයන්හි ඉදිරිපත් කර තිබේ.

i. එහි වූයේය යන අර්ථය - **භූතාර්ථය**

ගමෙහි වූයේ ගැමි - ගම්+ඉ = ගැමි+ආ = ගැමියා

ගැමියා නිදහස් නිවහල් දිවියක් ගෙවයි.

රැටියා, නියැරියා යන නාම ද මේ අර්ථයේ ම යෙදේ.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ii. එහි නියුතු වූයේ යන අර්ථය - **නියුක්තාර්ථය**

තොටෙහි නියුතු වූයේ තොටි - තොට + ඉ = තොටි + ආ = තොටියා

තොටියා හබල අතට ගත්තේ ය.

නැවි, දැහැමි, කැමි යන නාම ද මේ ගණයට අයත් වේ.

iii. එය දනී යන අර්ථය - **ජානනාර්ථය**

ශිල්ප ශාස්ත්‍රය දන්නේ ශිල්පි - ශිල්ප + ඉ = ශිල්පි + ආ - ශිල්පියා

මූර්ති **ශිල්පියා** මනහර ප්‍රතිමාවක් නිර්මාණය කළේ ය.

නැකති යන තද්ධිත නාමය ද මීට අයත් වේ.

iv. එය ම යන අර්ථය - **ස්වාර්ථය**

අඳුර ම - අඳුරු + ඉ = ඇඳිරි + අ = ඇඳිරිය

හිරු ගිලී ගියෙන් **ඇඳිරිය** රජ විය.

කැබලි, කැදලි, මැඳිරි, වැදලි යන තද්ධිත නාම ද මීට අයත් වේ.

2. 'වත්' 'මත්' ප්‍රත්‍යය

මේ ප්‍රත්‍යය දෙක ම 'ඇත්තේ ය' යන අර්ථයෙහි යෙදේ.

පෙර පදයේ අග අකුර හල් අකුරකින් හෝ අ, ආ, එ, ඒ යන ස්වරයකින් හෝ අවසන් වූ කල 'ඇත්තේ ය' යන අර්ථය සඳහා **වත් ප්‍රත්‍යය** යෙදෙයි.

සිල් ඇත්තේ - සිල් + වත් = සිල්වත් - **සිල්වත්** භික්ෂුව

ගුණ ඇත්තේ - ගුණ + වත් = ගුණවත් - **ගුණවත්** පුද්ගලයා

නුවණ ඇත්තේ - නැණ + වත් = නැණවත් - **නැණවත්** දරුවා

ධන ඇත්තේ - ධන + වත් = ධනවත් - **ධනවත්** පුද්ගලයා

පෙර පදයේ අග ඉ, ඊ, උ, ඌ යන ස්වරයකින් අවසන් වූ විට 'ඇත්තේ ය' යන අර්ථය සඳහා **මත් ප්‍රත්‍යය** යෙදේ.

රුව ඇත්තේ - රූ + මත් = රූමත් - **රූමත්** යුවතිය

ඉසුර ඇත්තේ - ඉසුරු + මත් = ඉසුරුමත් - **ඉසුරුමත්** මිනිසා

දිරිය ඇත්තේ - දිරි + මත් = දිරිමත් - **දිරිමත්** පුරුෂයා

නුවණ ඇත්තේ - ධී + මත් = ධීමත් - **ධීමත්** ශිෂ්‍යයා

2.1 **පහත ඉදිරිපත් කර ඇති එක් එක් අදහස සඳහා සුදුසු තද්ධිත පදය ලියන්න.**

i. සැප ඇත්තේ -
ii. කීර්තිය ඇත්තේ -
iii. වේග ඇත්තේ -
iv. බල ඇත්තේ -
v. ශක්ති ඇත්තේ -
vi. රස ඇත්තේ -
vii. ප්‍රයෝජන ඇත්තේ -
viii. බුද්ධි ඇත්තේ -

3. ‘මුවා’ ‘මය’ ප්‍රත්‍යය

‘එයින් කරන ලද’ ‘එම ස්වභාවය ඇති’ යන අර්ථය සඳහා යෙදේ.

රනින් කරන ලද - රන් + මුවා = රන්මුවා - **රන්මුවා** සිහසුන,
ස්වර්ණ + මය = ස්වර්ණමය - **ස්වර්ණමය** සිංහාසනය
මැණික්වලින් කරන ලද - මිණි + මුවා = මිණිමුවා - **මිණිමුවා** කිරුළ
මාණික්‍ය + මය = මාණික්‍යමය - **මාණික්‍යමය** කිරීටය

3.1 **පහත එක් එක් අදහස සඳහා යෝග්‍ය තද්ධිත පදය ලියන්න.**

i. යකඩයෙන් කරන ලද -
ii. පලිඟුවෙන් කරන ලද -
iii. රිදියෙන් කරන ලද -
iv. ලීයෙන් කරන ලද -
v. තන්තු ස්වභාව ඇති -

4. ‘අටි’ ප්‍රත්‍යය

මේ ප්‍රත්‍යය 1. හුරු වූයේ
2. ප්‍රදේශය යන අර්ථ දෙක සඳහා යෙදේ.

හුරු වූයේ:

කළුවට හුරු වූයේ - කළු + අටි = කළටි - **කළටි** පොල්
මෙළෙකට හුරු වූයේ = මොළොක් + අටි = මොළකැටි - **මොළකැටි** දරුවා

ප්‍රදේශාර්ථය

ඉඟ ප්‍රදේශය = ඉඟ+අටි = ඉඟටි - **ඉඟටිය** ලෙළවා
තුනු ප්‍රදේශය = තුනු + අටි = තුනටි - **තුනටියේ** වේදනාව

4.1 **පහත සඳහන් එක් එක් යෙදුම වෙනුවට සුදුසු ම තද්ධිත පදය ලියන්න.**

i. ඉහ ප්‍රදේශය -
ii. දිග ස්වභාවය -
iii. කර ප්‍රදේශය -

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

5. 'අස්' 'අත්' ප්‍රත්‍යය

'එය ම' යන අර්ථයේ (ස්වාර්ථයේ) යෙදේ.

සිසිල ම - සිසිල + අස් = සිසිලස්
මුදුන ම - මුදුන + අත් = මුදුනත්

5.1 **මේ එක් එක් අදහස සඳහා සුදුසු තද්ධිත පදය බැගින් ලියන්න.**

i. වරල ම - ii. මුහුළ ම -
iii. සවන ම - iv. නුවන ම -

6. 'තර' සහ 'තම' ප්‍රත්‍යය

'වැඩි බව' යන අර්ථය දීම සඳහා තර, තම යන ප්‍රත්‍යය දෙක යෙදේ.

මෙහි දී දෙකකින් එකක් වැඩි බව හැඟවීම සඳහා 'තර' ප්‍රත්‍යය යෙදෙන අතර සියල්ලෙන් ම වැඩි බව හැඟවීම සඳහා 'තම' ප්‍රත්‍යය යෙදේ.

උදාර ගුණ ඇති දෙදෙනකු අතුරින් වැඩි තැනැත්තා - උදාර + තර = **උදාරතර**
උදාර ගුණ ඇති සියලු දෙනා අතුරින් වැඩි - උදාර + තම = **උදාරතම**
පව් කරන දෙදෙනකු අතුරින් වැඩි තැනැත්තා - පාප + තර = **පාපතර**
පව් කරන සියල්ලන් අතුරින් වැඩි තැනැත්තා = පාප+ තම = **පාපතම**

6.1 **මේ අදහස සඳහා සුදුසු තද්ධිත පදය බැගින් ලියන්න.**

i. දෙදෙනකු අතුරින් ශ්‍රේෂ්ඨයා -
ii. සියල්ලන් අතුරින් ශ්‍රේෂ්ඨයා -
iii. දෙකක් අතුරින් වඩා මිහිරි -
iv. සියල්ල අතුරින් වඩා මිහිරි -
v. සියල්ලන් අතුරින් උතුම් වූ -

7. 'ඉක' ප්‍රත්‍යය

'ඊට අයත්' යන අර්ථයේ යෙදේ.

නගරයට අයත් - නගර + ඉක = නාගරික - **නාගරික** ජනයා
ව්‍යාපාරයට අයත් - ව්‍යාපාර + ඉක = ව්‍යාපාරික - **ව්‍යාපාරික** ප්‍රජාව
තමාට අයත් - පුද්ගල + ඉක = පෞද්ගලික - **පෞද්ගලික** අයිතිය
මුල් වූ කරුණට අයත් - මූල + ඉක = මූලික - **මූලික** අයිතිවාසිකම්

7.1 **මේ එක් එක් අදහස සඳහා යෝග්‍ය තද්ධිත පද ලියන්න.**

i. පුරාණ කාලයට අයත් -
ii. සංස්කෘතියට අයත් -
iii. සමාජයට අයත් -
iv. රසායනයට අයත් -
v. ගෝත්‍රයට අයත් -

8. 'ඉති' ප්‍රත්‍යය

'ස්වල්පය' යන අර්ථය සඳහා යෙදේ.

පැන් ස්වල්පය - පැන් + ඉති = **පැනිති**
කුඩා කැන - කැන් + ඉති = **කැනිති**
ඉතා ම පොඩි - පොඩි + ඉති = **පොඩිති**

8.1 **මේ එක් එක් අදහස සඳහා යෝග්‍ය පදය ලියන්න.**

i. කුඩා කැබලි -
ii. ඉතා ම සුග -
iii. කැඳ ස්වල්පයක් -
iv. කුඩා කිනිත්ත -

9.'ආණ' 'අණු' 'අණි' ප්‍රත්‍යය

ගෞරවාර්ථය සඳහා යෙදේ.

ගරු කටයුතු පියා - පිය + ආණ - පියාණ + ඕ = **පියාණෝ**
ගරු කටයුතු පුතා - පුත් + අණු - පුතණු + ඕ = **පුතණුවෝ**
ගරු කටයුතු දුව - දූ + අණි - දියණි + ඕ = **දියණියෝ**

9.1 **මේ එක් එක් අදහස සඳහා යෝග්‍ය තද්ධිත පදය ලියන්න.**

i. ගරු කටයුතු රජතුමා -
ii. ගරු කටයුතු සොහොයුරා -
iii. ගරු කටයුතු බෑනා -
iv. ගරු කටයුතු මව -

10. 'ඊය' ප්‍රත්‍යය

'එයට අයත් ය' යන අර්ථය සඳහා යෙදේ. ඒ හැර වෙනත් අර්ථ සඳහා ද ඊය ප්‍රත්‍යය යෙදේ.

ස්වදේශයට අයත් වූයේ - ස්වදේශ+ඊය - **ස්වදේශීය**
දේශයට අයත් වූයේ - **දේශීය**
කාර්යාලයට අයත් වූයේ - කාර්යාලය+ඊය - **කාර්යාලයීය**
පාපයට අයත් වූයේ - පාප+ඊය - **පාපීය**

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මෙම අරුතෙහි 'ඒය' ප්‍රත්‍යය ද යෙදේ. ලංකාවට අයත් වූයේ - ලංකා+ඒය - ලාංකේය

10.1 **මේ එක් එක් අදහස සඳහා යෝග්‍ය පදය ලියන්න.**

i. සතුට ඇති කරන - ii. ප්‍රදේශයට අයත් -
iii. මරණයට තුඩු දෙන - iv. සාධනය කළ යුතු -
v. විදේශයට අයත් -

11. 'ආ' ප්‍රත්‍යය

'බව' යන අර්ථය සඳහා යෙදේ.

මිහිරක් ඇති බව - මිහිරි + ආ - **මිහිරියා**
හැකියාවක් ඇති බව - හැකි + ආ - **හැකියා**
ළැදියාවක් ඇති බව - ළැදි + ආ - **ළැදියා**

11.1 **මේ එක් එක් අදහස සඳහා යෝග්‍ය පදය ලියන්න.**

i. නිහඬ බව - ii. බැඳීමක් ඇති බව -
iii. අඬන බව - iv. නම්‍යතාවක් ඇති බව -

12. 'තා' ප්‍රත්‍යය

භාවාර්ථය හා සමූහාර්ථය සඳහා යෙදේ.

භාවාර්ථය

මුදු බව - මුදු + තා - මුදුතා
සුහද බව - සුහද + තා - සුහදතා

සමූහාර්ථය

ජන සමූහය - ජන + තා - ජනතා

12.1 **මේ එක් එක් අදහස සඳහා යෝග්‍ය තද්ධිත පදය ලියන්න.**

i. දුර්වල බව - ii. ශූර බව -
iii. අවශ්‍ය බව - iv. විශේෂ බව -
v. දුබල බව -

ඉහත දැක්වූ තද්ධිත ප්‍රත්‍යයවලට අමතරව ව්‍යවහාරයේ පවතින තවත් තද්ධිත ප්‍රත්‍යය ඇත. මේ ඒවායින් කීපයකි.

ප්‍රත්‍යය	නිදර්ශනය	අර්ථය
අටු	අරටු (අර + අටු)	ඉතා හරය ඇති
අළ	ඉහළ (ඉස් + අළ)	හිස ප්‍රදේශය
බ	දියබ (ඹ) (දිය + බ)	ගැඹුරු දිය පෙදෙස
නු	ඉන්දියානු (ඉන්දියා + නු)	ඉන්දියාවට අයත්/සම්බන්ධ
ක	ජාතික (ජාති + ක)	ජාතියට අයත්
ත්ව	ප්‍රවීණත්ව (ප්‍රවීණ + ත්ව)	ප්‍රවීණ බව
ය	සෞන්දර්ය (සුන්දර + ය)	සුන්දර බව
වන්ත	ගුණවන්ත (ගුණ + වන්ත)	ගුණය ඇති
තන	පුරාතන (පුරා + තන)	පෙර කාලයට අයත්
ඊන	කාලීන (කාල + ඊන)	කාලයට අයත්
ඉෂ්ඨ	පාපිෂ්ඨ (පාප + ඉෂ්ඨ)	වඩා පාපී වූයේ

ලිඛිත අභ්‍යාස

1. **මේ වාක්‍යවල ඇති තද්ධිත පද උපුටා ලියන්න.**

   i. දිගටි මුහුණක් ඇති නැට්ටුවා සිය ඉඟටිය ලෙළවා රඟුම් පෑවේ ය.
   ii. ලක්දිවට පැමිණි විදේශිකයෝ පෞරාණික ශ්‍රී විභූතිය දැක සතුටු වූහ.
   iii. ගුරුතුමිය සිඟිත්තාට අලංකාර මල් කිනිත්තක් තෑගි කළා ය.
   iv. රූමත් යුවතිය සිය වරලස විදහා ගෙන විනිශ්චය මණ්ඩලය හමුවට පැමිණියා ය.
   v. කැහැටු බල්ලා මඩුව තුළ වකුටු වී නිඳයි.

2. **පහත දැක්වෙන ඡේදයේ ඉරි ඇඳි පද වෙනුවට තද්ධිත පද යොදා ලියන්න.**

   නොබෝදා විදේශ රටවලින් පැමිණි තැනැත්තෝ පුලතිසිපුර නැරඹීමට ගොස් එහි වූ ගලින් ම නිමැවුණු ප්‍රතිමා ද රනින් ම කළ ප්‍රතිමා ද දැවයෙන් කරන ලද රාජ මන්දිර ද බලා පසුව පැරකුම් සමුදුර වෙතට ගොස් එහි සිසිල ම විඳ ආදී ශ්‍රී ලාංකිකයාගේ අතිශය උදාර බව ද විශිෂ්ට ධෛර්යය ඇති බව ද යන ගුණ පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් කථා කළහ.

3. **මේ තද්ධිත පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.**

   සිඟිති, රජතමය, බලවත්, නැවියා, දොරටුව, සුහදතා, නැඟණියෝ, හැකියා

කෘදන්ත

කියන්නා කියන කියුම් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතු ය.

ඉහත වැකියේ ඇතුළත් '**කියන්නා,**' '**කියුම්,**' '**අසන්නා**' යන පද නාම පද වේ. එහි මුලින් ම දැක්වෙන 'කියන්නා' යන පදය සකස් වී ඇත්තේ කිය+නු+ආ = යන කොටස් එක් වීමෙන් ය. ඉහත 'කියුම්' යන පදය සෑදී ඇත්තේ 'කිය' යන ධාතු ප්‍රකෘතියට 'උම්' යන ප්‍රත්‍යය එක් වීමෙනි. 'අසන්නා' යන පදය සකස් වී ඇත්තේ අස+නු+ආ එක් වීමෙනි. මේ සියලු ම පද ධාතු ප්‍රකෘතියක් මුල් කර ගෙන නිර්මාණය වී තිබේ. 'කියන' යන පදය 'කිය' ප්‍රකෘතියට 'න' කෘදන්ත ප්‍රත්‍යය එක් වී සකස් වී ඇත.

මෙසේ ධාතු ප්‍රකෘතියකට කෘදන්ත ප්‍රත්‍යය එකතු වී සෑදෙන පද කෘදන්ත යනුවෙන් හැඳින්වේ. කෘදන්ත යන පදය කෘත්+අන්ත යන අවයව සංයෝගයෙන් සෑදී තිබේ. එහි අර්ථය 'කෘත් ප්‍රත්‍යයක් අන්ත කොට ඇති ක්‍රියා මූලයකින් සකස් වූව' යන්න යි.

කෘදන්ත නාම ද ප්‍රත්‍යයාර්ථවත්ව නිර්මාණය වන නිසා එය ප්‍රත්‍යයාර්ථ නාම සංඛ්‍යාවට ම අයත් වේ.

'නටයි' යන ක්‍රියා පදයේ මූලය 'නට' යන ධාතු ප්‍රකෘතිය යි. මෙහි දී කෘදන්ත නාම තැනෙන්නේ එම ධාතු ප්‍රකෘතිය මුල් කර ගෙන ය. 'නට' යන ධාතු ප්‍රකෘතියෙන් පහත සඳහන් ආකාරයේ කෘදන්ත පද සෑදෙයි.

ක්‍රියාව	ක්‍රියා ප්‍රත්‍යය	කෘදන්ත පද
නටයි	නට	නටන, නටනු, නැටූ, නැටුම්, නැටුම, නැටිලි, නැටෙනු, නැටෙන, නැටුණු, නැටීම, නටන්නා, නටන්නේ, නටන්නෝ, නැටෙන්නේ, නටන්නී

ඉහත රටාවට බොහෝ දුරට අනුකූලව ධාතු ප්‍රකෘති මූලිකව කෘදන්ත පද නිර්මාණය වේ.

කෘදන්ත*
- කෘදන්ත නාම
- කෘදන්ත ක්‍රියා

කෘදන්ත නාම

ධාතු ප්‍රකෘතියකට නාමාර්ථයක් දෙන කෘදන්ත ප්‍රත්‍යයක් එකතු වීමෙන් සෑදෙන නාම කෘදන්ත නාම ලෙස හැඳින්වේ. බලන්නා, බලන්නී, බැලීම්, බැලුම්, බැලිලි ආදිය කෘදන්ත නාම වේ.

★ කෘදන්ත නාම හා ක්‍රියාවලට අමතරව කෘදන්ත නිපාත ද වෙයි. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා ඊට අයත් වේ.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ධාතු ප්‍රකෘතිය	ප්‍රත්‍යය	කෘදන්ත නාම
කිය	උම් ඊම් න + ආ න + ඊ	කියුම් කීම් කියන්නා කියන්නී
රක්	උම් ඉලි ඉ + න + ඕ උම් + අ	රැකුම් රැකිලි රකින්නෝ රැකුම/රැක්ම

කෘදන්ත ක්‍රියා

භාෂා ව්‍යවහාරයේ දී කෘදන්ත නාම මෙන් ම කෘදන්ත ක්‍රියා ද අත්‍යවශ්‍ය භාෂාංගයක් වේ. ධාතු ප්‍රකෘතියකට ක්‍රියා අර්ථයක් දෙන කෘදන්ත ප්‍රත්‍යයක් එක් වී කෘදන්ත ක්‍රියා සැදේ. බලන්නේ, බලන්නාහු, බලන්නෙහි, බැලුවේ, බැලෙන්නේ, බැලුණේ, බැලුණු, බැලුණ, බැලුවා, බලනු ආදි පද කෘදන්ත ක්‍රියා ගණයට ඇතුළත් වේ.

ධාතු ප්‍රකෘතිය	ප්‍රත්‍යය	කෘදන්ත ක්‍රියා
කිය	න ඌ නු	කියන කියූ කියනු
රක්	ඉ + න එ + නු උණු ඉ + ඒ	රකින රැකෙනු රැකුණු රැක්කේ

ලිඛිත අභ්‍යාස

1. **මේ එක් එක් කොටසේ ඇතුළත් කෘදන්ත පද උපුටා ලියන්න.**

(අ) නටන නැටුම් ගයන ගැයුම් ඉවත හෙළයි සෝක සුසුම්

(ආ) දුම්බර කෙතට වැට බැඳලා රැකුම් බැලුම්
මාවිලි ගඟේ දිය බැඳලා කෙතට ගිලුම්
දුම්බර ලියෝ කර ඔසවා බලන බැලුම්
තුන්පත් රටාවකි දුම්බර කෙතේ නෙළුම්

(ඇ) ඔය බැල්ම ඔය කැල්ම නිලුපුල් නෙතේ...

(ඉ) ඉර බැස යන්නේ අඳුර ද වැටෙන්නා
සීත සුළං හැම අතින් හමන්නා
පහළ වෙලේ ගොවිලියන්ගෙ කවිතාලය
ඇසේ ඇසේ සඳ පායන්නා...

2. **මේ එක් එක් වාක්‍යයේ හිස්තැන/හිස්තැන් වාක්‍යය ඉදිරිපිට වරහන තුළ දී ඇති ක්‍රියා පදයේ මූලයෙන් සකස් කර ගෙන සම්පූර්ණ කරන්න.**

   i. කලා උලෙළ සඳහා දැරිය ඉදිරිපත් කළ .... කාගේත් සිත් ගත්තේ ය. (නටයි)

   ii. කුඹුරුයායේ ගොයම් .... සඳහා ගමේ තරුණ තරුණියෝ ද පැමිණියහ. (කපයි)

   iii. ඒ ඒ සිද්ධි පිළිබඳව .... කෙසේ කීවත් .... සිහි බුද්ධියෙන් ඇසිය යුතු ය. (කියයි/අසයි)

   iv. මෙවර දළදා පෙරහැරේ .... නමගිය .... ශිල්පියෙකි (නටයි).

   v. ළමයා විසින් .... පුවත්පත් ය. (බලයි)

3. **මේ එක් එක් වාක්‍යයේ තද කළු අකුරෙන් දක්වා ඇති කෘදන්ත පදවල ප්‍රත්‍යය වෙන් කොට ලියන්න.**

   i. ශිෂ්‍යයා හොඳින් පිළිතුරු **ලියනු** පෙනේ.

   ii. ලී කෙළි **නැටුම්** ඉදිරිපත් කළේ කලායතනයකිනි.

   iii. විශේෂාංග ලිපියේ **කැපිලි කෙටිලි** නිම කර මුද්‍රණයට යැවිණි.

   iv. ධාවන පථයේ වේගයෙන් **දුවන** දරුවන්ට දෙමාපියෝ අත්පොළසන් දුන්හ.

   v. වැඩිහිටියන්ගේ **කියමන්** බාල පරපුර සිතට ගත යුතු ය.

4. **පහත සඳහන් ධාතු ප්‍රකෘතිවලින් කෘදන්ත නාම හා කෘදන්ත ක්‍රියා දෙක බැගින් නිර්මාණ කරන්න.**

   බල, ගය, වය, ලිය, දුව

5. **පහත සඳහන් කෘදන්ත පද යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.**

   ලියන්නා, නැටුම්, කොටනු, සිතීම, කෙඳිරිලි, කැපිල්ල, බැලීම, දුවන්නේ